# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල



තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 723 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 28/04/2024 පැය 0550

## මාධ්‍ය නිවේදනය

**01. නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කැළණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය .**

2024.04.27 වන දින දහවල් කාලයේ කඳාන පොලිස් වසමේ හැමිල්ටන් ඇල ප්‍රදේශයේදී කැළණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 1870 ක් (බැරල් 11) ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන කඳාන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන කලඑළිය, ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කඳාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. නීති විරෝධී මත්පැන් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - ඇහැටුවැව පොලිස් ස්ථානය .**

2024.04.27 වන දින සවස් කාලයේ ඇහැටුවැව පොලිස් වසමේ වල්පාලුවත්ත ප්‍රදේශයේදී ඇහැටුවැව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 76 ක් (බෝතල් 102) සමඟ සැකකාරියක් අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 43 ක් වන ඇහැටුවැව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ඇහැටුවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ඕමන්ත පොලිස් ස්ථානය.

2024.04.27 වන දින සවස් කාලයේදී ඕමන්ත පොලිස් වසමේ කිලවිකුලම් ප්‍රදේශයේදී ඕමන්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක්වූ පාලමොටෛ, ඕමන්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඕමන්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. දියේ ගිලී මියයාමක් -නොච්චියාගම පොලිස් වසම.

2024.04.27 වන දින උදෑසන කාලයේදී නොච්චියාගම පොලිස් වසමේ මානෙල් වැවේ ගිලී පුද්ගලයෙකු අතුරුදහන් වී ඇති බවට නොච්චියාගම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත. පොලිස් නිලධාරීන් එම ස්ථානයට ගොස් පරික්ෂා කිරීමේ දී දියේ ගිලී අතුරුදන් වූ පුද්ගලයාගේ සිරුර ප්‍රදේශවාසීන් විසින් ගොඩට ගෙන තිබී ඇත.

**මරණකරු වයස අවුරුදු 21 ක් වූ හල්මිල්ලෑව, නොච්චියාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු මානෙල් වැවේ මසුන් ඇල්ලීම සඳහා ගොස් සිටියදි මෙලස දියේ ගිලී ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. නොච්චියාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - පිටකොටුව පොලිස් වසම.

2024.04.27 වන දින උදෑසන කාලයේදී පිටකොටුව පොලිස් වසමේ ඕල්කට් මාවත දෙවන හරස් වීදිය ප්‍රදේශයේදී ගුණසිංහපුර දෙස සිට සිනුර් හන්දිය දෙසට ගමන් ගත් යතුරුපැදියක් පදික මාරුව මතින් මාර්ගය හරහා ගමන් කල පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා බරපතල තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට අදාල යතුරුපැදිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර පිටකොටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - දොම්පේ පොලිස් වසම.

2024.04.27 වන දින සවස් කාලයේදී දොම්පේ පොලිස් වසමේ පුවුපාගල වානලුවාව මාර්ගයේ උක්කොටුව ප්‍රදේශයේදී පුවුපාගල දෙස සිට වානලුවාව දෙසට ගමන් කල කාර් රථයක පිටුපසින් පැමිණි යතුරුපැදියක් ගැටීමෙන් පැදිකරු මාර්ගය දෙසට ඇද වැටී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක ගැටී

අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු දොම්පේ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් වූ කපුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දොම්පේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් පසු ලොරි රථය පලාගොස් ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා දොම්පේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු ගෙන යනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - අනුරාධපුරය පොලිස් වසම.

2024.04.27 වන දින සවස් කාලයේදී අනුරාධපුරය පොලිස් වසමේ අනුරාධපුරය පුත්තලම මාර්ගයේ පණ්ඩුලගම ප්‍රදේශයේදී අනුරාධපුරය දෙස සිට පුත්තලම දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගයේ දකුණු පස ඇති අතුරු මාර්ගයකට හැරවීමට යාමේදී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු අනුරාධපුරය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 42 ක් වූ පණ්ඩුලගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුරය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට අදාල බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අනුරාධපුරය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**